" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/ADM/18-38/FI/01-2020
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2020-06-10

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
ලේකම්, (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන ඒකකය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරී,

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020, 07/2020(I) හා 07/2020(II) බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>**

පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/2 හා 2020.05.14 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත. (එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020, 2020-03-26 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(I), 2020-03-29 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(II), 2020-04-04 | නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින්, ආයතන ප්‍රධානින් හා නිලධාරින් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

කේ.ඒ. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),
ප්‍රධාන ලේකම් (බ.ප.) වෙනුවට.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2020(I)

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.03.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම</u>**

ඉහත මැයෙන් 2020.03.26 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020හි 02 වගන්තිය, ජනාධිපති විධානයකට අනුව පිහිටුවා ඇති නව කොරෝනා වෛරස් තත්ත්වය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ කාලය තුළ ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ භාණ්ඩ, සේවා හා අනෙකුත් පහසුකම් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, අධීක්ෂණය සහ පසුවිපරම පිණිස පත්කර ඇති ජනාධිපති කාර්ය සාධක බලකායේ උපදෙස් අනුව පහත පරිදි සංශෝධනය කෙරේ.

> **"02. 2020 අප්‍රේල් මස වැටුප, අප්‍රේල් මස 08 දින ගෙවීමට කටයුතු කරන අතර, පවත්නා සුවිශේෂී තත්ත්වය සැලකිල්ලට ගෙන සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සඳහා වන උත්සව අත්තිකාරම් අනියම් හෝ ආදේශක පදනම මත සේවය කරන අයට පමණක් ගෙවීමට කටයුතු කරනු ඇත."**

02. තවද, නව කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා රජයේ නිලධරයන්ට විශේෂ නිවාඩු ලබාදීම ආරම්භ වූ දිනය වන විටත් අනියම් හෝ ආදේශක පදනමින් රජයේ ආයතනවල සේවයේ නිරතව සිටි අයට එම විශේෂ නිවාඩුව ආරම්භ කළ දිනෙන් පසු සේවයට වාර්තා නොකළ ද මෙම වසරේ අප්‍රේල් සහ මැයි මාස සඳහා ස්ථිර රජයේ නිලධරයන්ට වැටුප් ගෙවීමට නියමිත දිනයන් තෙක් විශේෂ නිවාඩු ලබා දී ඇති දින වෙනුවෙන් ඔවුන් සේවයට වාර්තා කළා සේ සලකා අදාළ පරිදි දෛනික වැටුප් ගෙවීමට සියලුම ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතු ය.

03. මෙම චක්‍රලේඛය ජනාධිපති කාර්යාලයේ උපදෙස් අනුව හා මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය